# ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය යටත්විජිත ආධිපත්‍ය වර්ධනය

ඉන්දික ඉහළගෙදර, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මානව ශස්ත්‍ර අධ්‍යනාංශය, සාමාජීය විද්‍යා සහ මානව ශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය,

බටහිර යටත්විජිතවාදයට ආසියා, අප්‍රිකා සහ ලතින් ඇමරිකානු රාජ්‍යයන් 15 වන සියවසේ අග භාගයේ සිට නතු විය. විශේෂයෙන්ම බටහිරින් පැමිණි ආර්ථික, සමාජ සංස්කෘතික සහ දේශපාලන බලපෑම තුළින් එකී සමාජයන්හි පරිවර්තන රැසක් හඳුනාගත හැකි වේ. යුරෝපීය ආධිපත්‍යය ආසියා, අප්‍රිකා සහ ලතින් ඇමරිකානු රාජ්‍යයන් කෙරෙහි ව්‍යාප්ත කළ මෙම අවධිය සම්භාව්‍ය යටත්විජිතවාදී යුගය[81] ලෙස හඳුන්වනු ලැබේ. මෙරට බටහිර යටත්විජිතවාදී යුගයේ ආරම්භය 16 වන සියවස ආරම්භයේ දී සිදුවූ පෘතුගීසි ආගමනයත් සමඟ හඳුනා ගත හැකි වේ. මෙම අධ්‍යයනයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ කන්ද උඩරට රාජධානියේ බ්‍රිතාන්‍ය ආධිපත්‍ය පිහිටුවීම හා ව්‍යාප්තිය පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා ය.

පෘතුගීසි ආගමනයෙන් පසු මුහුදු බඩ ප්‍රදේශවල මෙතෙක් පැවති සිංහල දේශපාලන ආධිපත්‍යය බිඳ වැටීමට ලක් වූ අතර, මෙම පසුබිම මත උඩරට රාජධානිය ක්‍රමයෙන් ස්වාධීන රාජධානියක් ලෙස වර්ධනය විය. මෙය මුහුදු බඩ කේන්ද්‍ර කර ගනිමින් පැවති යුරෝපීය පාලනයට ක්‍රිස්තියානි මිෂනාරී ව්‍යාප්තියට මෙන්ම, යුරෝපීය වාණිජවාදී ප්‍රතිපත්තිවලට ද තර්ජනයක් විය. 16 වන සියවසින් පසු මෙරට ඉතිහාසයේ උඩරට රාජධානියට සුවිශේෂී ස්ථානයක් හිමිවේ. බටහිර යටත්විජිත බලයක් මෙතැන් සිට උඩරට ස්වාධීනත්වය බිඳ දැමීමට කටයුතු කිරීම මෙරට දේශපාලන ඉතිහාසයේ හඳුනා ගත හැකි ප්‍රමුඛ ලක්ෂණයකි. විශේෂයෙන්ම උඩරට ප්‍රදේශවල ඉඩම් භුක්තිය රාජ්‍ය පාලන තන්ත්‍රයට ඇදී තිබුණි. උඩරට ආර්ථිකය සම්ප්‍රදායික වාරිමාර්ග පද්ධතිය මත යැපුණු ආර්ථිකයක් නොවේ. කෘෂිකාර්මික අර්ථ ක්‍රමය මූලික වශයෙන් රඳා පැවතුනේ මඩ ගොවිතැන මතයි. "භූපති" සංකල්පය පැවතුන ද සත්‍ය වශයෙන්ම රජුට හිමිවූ රටවැසියන්ගෙන් ගෙවීමක් නොකර සේවය ලබා ගැනීම රඳා පැවතුනේ ඔහුගේ බිම් වගා කිරීම සඳහා පුළුල් ලෙස පැතිර ගිය රටවැසියාගේ අයිතිවාසිකම් මත ය. ඔවුන්ගේ ආර්ථික ශක්තිය ප්‍රධාන වශයෙන් පැන නැගුනේ උඩරට රාජධානියේ වඩාත් ම ප්‍රචලිත හා පොදුජන සම්පත වූ ඉඩම්වලිනි.[82] රට අභ්‍යන්තරයේ වාසය කළ මිනිසුන්ගේ අවශ්‍යතා සීමා සහිත වූ අතර ඒවා පහසුවෙන් ම සපුරා ගත හැකි

---

81 බණ්ඩාරගේ, අශෝකා, **ශ්‍රී ලංකාවේ යටත්විජිතවාදය**, ස්ටැම්ෆර්ඩ් ලේක් ප්‍රකාශන, පන්නිපිටිය 2005, 1 පිට.

82 කුලසේකර, කේ.එම්.පී. "කන්ද උඩරට රාජධානියේ අභ්‍යන්තර ගතිකතා සහ එම රාජ්‍යයේ බිඳවැටීම", **ශ්‍රී ලාංකේය ඉතිහාසය, වෙළුම IV**,ප්‍රධාන සංස්කාරක, ඩබ්.එම්.කේ.විජේතුංග සහ වෙනත් අය, ගුණසේන ප්‍රකාශන, කොළඹ, 2012, 19 පිට.

විය. මේ නිසා සාමාන්‍යයෙන් වාණිජ කටයුතු අල්ප විය. රාජකාරි ක්‍රමය හේතු කොට ගෙන එදිනෙදා ආර්ථික හුවමාරුවල දී මුදල් භාවිතය බොහෝ දුරට මඟ හැරුනි. භාණ්ඩ විකිණීම හා මිලදී ගැනීම ද්‍රව්‍ය හුවමාරුව මගින් සිදු විය. කන්ද උඩරට වෙළඳාමේ පැවති මෙම ලක්ෂණ හේතු කොට ගෙන එනම් ද්‍රව්‍ය හුවමාරුව ප්‍රමුඛ වීම, මුදල් හුවමාරුව සීමා වීම සහ ප්‍රවාහනය සීමා වීම ආදී කරුණු මත පැවති ස්වයංපෝෂිත බවට හෝ කුලය පදනම් කර ගත් වෘත්තීය සුවිශේෂීකරණයට එමගින් බලපෑමක් කිරීමේ අවස්ථාවක් නැති බව පැහැදිලි ය.[83]

උඩරට රාජධානියේ පැවති මෙම වාතාවරණය මුහුදුබඩ පෘතුගීසී පාලනයක් අරමුණු සහ අපේක්ෂා ඉටු කර ගැනීමට බාධාකාරී විය. පෘතුගීසීන් අවස්ථා කීපයකදී ම උඩරට අත් කර ගැනීමට ප්‍රයත්න දැරූ අතර ඒවා සියල්ල අසාර්ථක විය.[84] ඒ සියල්ලටම වඩා උඩරට රාජ්‍යය වෙත පැවරුන වැදගත්ම කාර්යය වූයේ පහතරට ප්‍රදේශ යටත් කර ගෙන සිටි විදේශිකයින්ගෙන් එල්ල වූ තර්ජනවලට එරෙහිව නැගී සිටීම හා ඔවුන් දිවයිනෙන් පලවා හැරීමයි. මෙරට බටහිර යටත්විජිතවාදයේ දෙවන ප්‍රකාශනය ලෙස මුහුදු බඩ ප්‍රදේශ 1658 දී ලන්දේසීන් අත්පත් කර ගැනීම සැලකිය හැකි ය. පෘතුගීසීන්ට සාපේක්ෂව ලන්දේසීහු ක්‍රමානුකූල වාණිජ ප්‍රතිපත්තියක් අනුගමනය කළහ. ලන්දේසි වාණිජ ප්‍රතිපත්තියේ ද මූලික අරමුණ වූයේ දිවයිනේ වාණිජ ඒකාධිකාරිය සියතට ගැනීමයි. මෙම අරමුණ ඉටු කර ගැනීමේ දී ලන්දේසීන් මුහුණ දුන් ප්‍රධාන බාධකය වූයේ ද උඩරට රාජධානියයි.[85] විශේෂයෙන් ම උඩරට පාලකයා සතුව තවදුරටත් වාණිජ වරායන් කීපයක් පැවතීම ලන්දේසී වාණිජ ප්‍රතිපත්තියට බාධාවක් විය. උඩරට පාලකයා වූ දෙවන රාජසිංහගේ ක්‍රියාකලාපය මෙහි දී වැදගත් වන අතර, රජුගේ ක්‍රියාකාරකම් හමුවේ ලන්දේසි වරායන් මෙන්ම, වෙළඳාමේ පාලනය ද සියතට ගැනීමට සමත් වූහ. මෙහිදී කන්ද උඩරට රාජධානිය තනි වූ ස්වයංපෝෂිත යටත් රාජ්‍යයක් බවට පත්වූයේ තවමත් ඉතිරි වී තිබූ දේශපාලන නිදහස අර්ථ විරහිත එකක් බවට පත් කරමිනි.[86]

මෙරට යටත්විජිතවාදී ව්‍යූහය කෙරෙහි අවධානය යොමු කරන විට 18 වන සියවස වැදගත් කාලපරිච්ඡේදයක් ලෙස හඳුනා ගත හැකි වේ. මෙතෙක් මෙරට මුහුදුබඩ ඇතුළු ආසියාතික ප්‍රදේශ කෙරෙහි බලය ව්‍යාප්ත කරගෙන සිටි පෘතුගීසි බලය 18 වන සියවසේ ආරම්භය වන විට ආසියාතික ප්‍රදේශවලින් තුරන්වීමත්, ලන්දේසි

---

83 බණ්ඩාරගේ, 2005, 38 පිට.

84 අර්සරත්නම්, එස්., **ලංකාවේ ලංදේසී බලය 1658 - 1687,** අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ, 1974, 52 පිට.

85 දේවරාජ,ලෝනා,ශ්‍රීමතී, **උඩරට රාජධානිය,1707-1782**,ලේක්හවුස් ප්‍රකාශන,කොළඹ,1988, 21 පිට.

86 එම, 29 පිට.

යටත්විජිත නැගෙනහිර ඉන්දීය කොදෙව් දක්වා ව්‍යාප්තවීමත් ඒ තුළින් මෙරට පිහිටීම ලන්දේසීන්ට නොවැදගත්වීමත් හඳුනාගත හැකි මුඛ්‍ය ලක්ෂණයකි. යුරෝපා පසුබිමෙහි යටත්විජිතවාදී දෘෂ්ඨිය වෙනස්වීම සහ පෘතුගීසි හා ලන්දේසි රාජ්‍යයන් අනුගමනය කළ ක්‍රියාමාර්ග හේතු කොට ගෙන මෙවන් තත්ත්වයක් නිර්මාණය විය. මීට සාපේක්ෂව ආසියාතික රාජ්‍යයන් කෙරෙහි නව යුරෝපීය බලයන් දෙකක් තරඟකාරී ලෙස ආගමනයවීමක් දක්නට ලැබේ. එනම් මහා බ්‍රිතාන්‍ය සහ ප්‍රංශයයි. බ්‍රිතාන්‍ය පෙරදිග ඉන්දීය වෙළඳ සමාගම සහ ප්‍රංශ පෙරදිග ඉන්දීය වෙළඳ සමාගම ලෙස ක්‍රියාකාරීව යටත්විජිත අධිරාජ්‍යයන් ස්ථාපිත කිරීම මෙම රාජ්‍යයන්හි මූලික අරමුණ විය.

ඉන්දීය සාගර කලාපයේ ඇතිවූ රාජ්‍ය තාන්ත්‍රික ස්වරූපයේ  වෙනස්වීම මත මෙරට මුහුදු බඩ ප්‍රදේශ 1796 දී ලන්දේසීන්ගෙන් අත්පත් කර ගැනීමට බ්‍රිතාන්‍යයයෝ සමත් වූහ.[87] ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශ බ්‍රිතාන්‍යයන් අතට පත් වූයේ ස්ටැත්හෝල්ඩර්වරයාගේ ලිපිය අනුව නොව යුද බලය නිසා හෙයින් ඒවා බ්‍රිතාන්‍යය යටත් වූ ප්‍රදේශ ලෙස සැලකේ. 1795 සිට 1796 කාලය තුළ මෙරට මුහුදුබඩ ප්‍රදේශ සිය අණසකට නතු කර ගැනීමට බ්‍රිතාන්‍ය පෙරදිග ඉන්දීය වෙළඳ සමාගම සමත් විය. 1796 පෙබරවාරි 15 වන දින යටත්වීම පිළිබඳ ගිවිසුමට අත්සන් තැබීමත් සමඟ දිවයිනේ සියලු ලන්දේසි ප්‍රදේශ බ්‍රිතාන්‍යන් අතට පත්වීම සම්පූර්ණ විය.[88] 1802 වන විට බ්‍රිතාන්‍ය ඉන්දියානු අධිරාජ්‍ය ආරක්ෂා කර ගැනීමට  අත්‍යවශ්‍ය ප්‍රදේශයක් වූ ලංකාව ද ස්ථිර වශයෙන්ම බ්‍රිතාන්‍ය යටත්විජිතයක් බවට පත්කර ගන්නා ලදී.

මෙම කාල පරිච්ඡේදය වන විට ලංකාවේ එතෙක් පැවති ආර්ථික ව්‍යුහය හෝ සමාජ සංස්ථා මූලික වෙනසකට භාජනය කිරීමේ අවශ්‍යතාව බ්‍රිතාන්‍ය පාලනය තුළින් ඉදිරිපත්ව තිබුණේ නැත. නමුත් ලංකාවේ තම බලය තහවුරු කර ගැනීමට ද පවත්වාගෙන යාමට ද ඔවුන් විසින් ගනු ලැබූ යම් යම් පියවර නිසා සම්ප්‍රදායික ආර්ථික ව්‍යුහයේ පූර්ණ පරිවර්තනයක් සිදු කළ යුතු බව ඔවුන්ට අවබෝධ විය. එංගලන්තයේ කාර්මික ප්‍රාග්ධන අවශ්‍යතාවන් මෙරටට බලපෑම් ඇති කරන ලදී. මෙහි අනිවාර්ය ප්‍රතිඵලය වූයේ යුරෝපීය ධනේශ්වර පංතියට ස්වකීය අයෝජන සඳහා සුදුසු පරිසරයක් මෙරට තුළනිර්මාණය කිරීමය. ඒ සඳහා සුදුසු ඉඩ ප්‍රස්තාව බ්‍රිතාන්‍යයන්ට හිමි වූයේ 1815 න් පසුව ය. රජු හා රදල ප්‍රධානීන්ගෙන් අතර වූ උඩරට රාජ්‍යයේ දේශපාලන ව්‍යුහය හා නෛසර්ගිකව බද්ධව පැවති මෙම

---

87 කරුණානන්ද, යු.බී., ''මුහුදු බඩ ප්‍රදේශ බ්‍රිතාන්‍යයන් විසින් අත්පත් කර ගැනීම.'', **ශ්‍රී ලාංකේය ඉතිහාසය,** වෙළුම ෑ1, ප්‍රධාන සංස්කාරක, ඩබ්.එම්.කේ.විජේතුංග සහ වෙනත් අය, ගුණසේන ප්‍රකාශන, කොළඹ, 2012, 58 පිට.

88 එම, 57 පිට.

සාමාන්‍ය ගැටුම මුහුදුබඩ ප්‍රදේශවල සිටි ඉංග්‍රීසීන්ගේ ක්‍රියාකාරිත්වය පිළිබඳ බාහිර සාධකය හේතු කොට ගෙන වර්ධනය වී හා උත්සන්න විය.[89]

උඩරට රාජධානිය අත් කර ගැනීම පිළිබඳ සඳහන් වන ප්‍රාරම්භක වාක්‍යයෙන් ඉංග්‍රීසීන් උඩරට රාජ්‍යයේ ස්වාමීන් බවට පත් වූයේ සතුරු ජාතියකට විරුද්ධව සිදු කළ ආක්‍රමණයක ප්‍රතිඵලයක් වශයෙන් නොවන බව පැහැදිලි ය. කන්ද උඩරට රාජධානිය ස්වාධීනව පැවතීම බ්‍රිතාන්‍ය ආධිපත්‍ය පිහිටුවීමට බාධාවක් විය. මෙම ප්‍රදේශය හේතු කිහිපයක් මත ඉංග්‍රීසීනට වැදගත් විය. උඩරට යටත් කර ගතහොත් බ්‍රිතාන්‍යයන් යටතේ වූ ත්‍රිකුණාමල වරායත් බටහිර වෙරළබඩ ප්‍රදේශයන් අතර මාර්ගයක් තැනීමට හැකිවීම ද ප්‍රමුඛ විය. උඩරට ප්‍රදේශයේ නිෂ්පාදිත ආහාර ද්‍රව්‍ය පහතරට අහාර අවශ්‍යතාවය සපුරාලීමට හැකි විය. මේ වන විට ආධිපත්‍ය තහවුරු කිරීමෙන් ඒවා මගහරවා ගැනීමට හැකිබව විශ්වාස කළේ ය. උඩරට ආක්‍රමණය සිදු වූයේ රදල ප්‍රධානීන්ගේත්, මහජනතාවගේත් ඉල්ලීම මත බව පැහැදිලි ව පෙනීයයි. උඩරට රාජධානියේ විශේෂයෙන් ම එහි අවසාන සමයේ දී දකින්නට ලැබුණු ප්‍රධානතම හා කැපී පෙනෙන ලක්ෂණය වූයේ එහි පැවති දේශපාලන අස්ථාවරත්වය උග්‍ර අතට හැරීමයි.[90] මේ අනුව උඩරට ප්‍රදේශ ඉංග්‍රීසීන්ට අයත් වූයේ කොන්දේසි උඩ යටත් කර ගැනීමකින් නොව, කොන්දේසි උඩ භාර දෙනු ලැබීමෙනි. 1815 දී දෙපාර්ශවය අතර ගිවිසුම අත්සන් කිරීමෙන් පසු නෛතික වශයෙන් උඩරට ගිවිසුම අනුල්ලංඝනීයත්වයට පත්විය.

1815න් පසු මෙම බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ පූර්ණ යටත්විජිතයක් බවට පත් විය. බ්‍රිතාන්‍ය වාණිජ අභිලාෂයන් ඉටු කර ගැනීමට මෙතැන් සිට අවකාශ විවර විය. ඒ සඳහා බ්‍රිතාන්‍යයන් පෙළඹවූ කරුණු මෙරට තුළින්ම නිර්මාණය වී තිබුණි. 1796 සිට මුහුදුබඩ පළාත්වල බ්‍රිතාන්‍ය යටත්විජිතය නිර්මාණය කරලීම ඉලක්ක කර ගෙන ඔවුන් විසින් ගෙන යමින් තිබූ කටයුතු කන්ද උඩරට ප්‍රදේශයට ද බලපාන ආකාරයට ඉදිරියට ගෙන යාම 1815 න් පසුව ඇරඹුනි. මෙම පියවරයන්ගේ ප්‍රතිඵලය වූයේ සම්ප්‍රදායික සංස්ථාවන්ගේ ශක්තිය දුර්වල වීමයි. ශ්‍රී ලංකාව 1802 සිටම බ්‍රිතාන්‍ය විජිතයක් (Crown Colony)ලෙස පැවති නමුත් මෙරට ආර්ථික සමාජයීය, දේශපාලන වෙනස්කම් ඇති කිරීම පිළිබඳ අවධානය යොමු කිරීමට බ්‍රිතාන්‍යයන්ට අවස්ථාවක් නොවීය. ආර්ථික අවශ්‍යතා ඉලක්කගත කර ගනිමින් කටයුතු කිරීම ආරම්භ වනුයේ 1832 දී හඳුන්වා දුන් කෝල්බෲක් හා කැමරන් ප්‍රතිසංස්කරණවලින් පසුවයි.

1802 සිට 1832 දක්වා කාල පරිච්ඡේදය බ්‍රිතාන්‍යයන්ට මෙරට මෙන්ම තම මව් රටෙහි ද අවිවේකි අවධියක් විය. විශේෂයෙන් ම ප්‍රංශ විප්ලවයෙන් පසුව "

89 කුලසේකර, 2012, 18 පිට.

90 එම, 22 පිට.

යුරෝපය පාලනය කිරීමේ යතුර" ලෙස ඉතිහාසඥයින් හඳුන්වනු ලැබූ යුරෝපීය නැපෝලියානු යුගයේ ආරම්භයයි. 1800 න් පමණ පසු නැපෝලියානු ආක්‍රමණ හේතු කොට ගෙන මහා බ්‍රිතාන්‍යය බාහිර මෙන් ම අභ්‍යන්තර වශයෙන් ද විශාල අභියෝගයකට මුහුණ දුනි. සිසැල්පයින් සමූහාණ්ඩුව යුරෝපයේ බල සමතුලිතතාවය බිඳ දමමින් ප්‍රංශය විසින් අධිරාජ්‍යයක් නිර්මාණය කරමින් සිටීම මෙම අභියෝගයයි. මේ අනුව 19 වන ශත වර්ෂයේ මුල් භාගය තුළ යුරෝපයේ පැවතියේ යුදමය වාතාවරණයකි. කාර්මික විප්ලවය සිදු වීම හේතු කොට ගෙන යුරෝපීය ආර්ථික බලවතා ලෙස එංගලන්තයට ප්‍රමුඛ ස්ථානයක් හිමි විය. නැපෝලියන්ගේ ප්‍රධානතම ඉලක්කය බවට එංගලන්තය පත් වීමට මෙයද හේතු වී තිබිණ

1815 උඩරට ගිවිසුමෙන් පසු මෙරට මුළුමනින් ම විජිතයක් බවට පත් වූ අතර මෙරට පැවති ස්වාධීනත්වය ද බිඳ වැටුණි. මුහුදුබඩ ප්‍රදේශ පාලනය කළ 1815 ට පෙර පවා බ්‍රිතාන්‍යයෝ ස්වකීය දේශපාලන ස්ථාවරත්වය ක්‍රමයෙන් තහවුරු කර ගනිමින් සිටියහ. මේ බව වඩාත් පැහැදිලි වනුයේ 1801 සහ 1805 යන වර්ෂවල දී බ්‍රිතාන්‍යයන් අනුගමනය කළ පියවර හඳුනා ගැනීමෙනි. 1801 දී මෙතෙක් රදල ප්‍රධානින් භුක්ති විඳි අධිකරණ බලතල බ්‍රිතාන්‍ය සිවිල් සේවකයන්ට පැවරීම සිදු කළහ. 1805 දී ප්‍රධානින් පත් කිරීමේ බලය ආණ්ඩුකාරවරයා අතටම පත් කරන ලදී. මීට අමතරව පහළ මට්ටමේ නිලධාරින් පත්කිරීමේ බලය හා අදායම් එකතු කිරීමේ කටයුතු බ්‍රිතාන්‍ය සිවිල් සේවකයින්ට පවරන ලදී. මෙවැනි තත්වයක් තුළබ්‍රිතාන්‍යයන් ස්වකීය බලය සෑම ක්ෂේත්‍රයක් තුළින්ම වර්ධනය කර ගැනීමට කටයුතු කළ බව හඳුනාගත හැක. බ්‍රිතාන්‍යයන්ගේ අවධානය මින් පසු යොමු වූයේ මෙරට තුළින් තමන්ට පක්ෂපාත ජන කොටස් නිර්මාණය කර ගැනීම කෙරෙහි ය. මේ වන විට බ්‍රිතාන්‍යයන්ට පක්ෂපාත දේශීය ජන කොටස් සිටි අතර ඔවුන් ක්‍රිස්තියානි ආගමට හරවා ගැනීම තවත් පරමාර්ථයක් විය. මෙම අරමුණු ඉටු කර ගැනීමේදී බ්‍රිතාන්‍ය පාලනය මුහුණදුන් ප්‍රබලතම අභියෝගය වූයේ අධ්‍යාපන කටයුතු රජයට පමණක් ක්‍රියාත්මක කිරීමට ශක්තිය නොවීමයි. මේ හේතුව මත බ්‍රිතාන්‍යය ක්‍රිස්තියානි මිෂනාරි සංවිධානවලට අධ්‍යාපනය භාර කරන ලදී. බැප්ටිස්ට්, වෙස්ලියන්, ඇමරිකන් සහ රෝමානු කතෝලික මිෂනාරි සංවිධාන මෙන්ම, චර්ච් මිෂන් සමිතිය ද මේ කාල පරිච්ඡේදය තුළ මෙරට ස්ථාපනය කරන ලදී. ඉතා කෙටි කලක් ඇතුළත ක්‍රියාකාරී සංවිධාන තුළ පැවති කැපවීම සාර්ථක වූ බව හඳුනා ගත හැකි ය.

1805 දී තෝමස් මෙට්ලන්ඩ් ආණ්ඩුකාරවරයා ලෙස බලයට පත් විය. මෙම වාතාවරණය ස්වකීය වාසියට ගත් හෙතෙම, අවි බලයෙන් උඩරට ඇල්ලීමේ ක්‍රියාවලිය නවතා දැමූ ඔහු කාහටත් නොපෙනෙන පරිදි උඩරට රාජ්‍යයේ

අත්තිවාරම බිඳීමේ ප්‍රතිපත්තියක් ගෙන ගියේය.[91] මෙම කාර්ය ඉටු කර ගැනීම සඳහා ජෝන් ඩොයිලිගෙන් ඉටු වූ මෙහෙවර ඉතා වැදගත් වේ. හෙතෙම සිංහල භාෂාව කථා කිරීමට හැකි සිංහල උගතුන් හා කපටි ලෙස ආශ්‍රය කළ බව පෙනේ. සිංහල සංස්කෘතිය හා බද්ධව ක්‍රියා කිරීමෙන් උඩරට රාජ්‍ය තතු දැන ගැනීම සඳහා චරපුරුෂයකු ලෙසත් කටයුතු කරන ලදී.[92] උඩරට භේදකාරී පසුබිම පුළුල්වත් ම නව ආණ්ඩුකාරවරයා ලෙස ක්‍රි.ව.1812 සිට රොබට් බ්‍රවුන්රිග් කටයුතු කරන ලදී. උඩරට රජුගේ පීඩාකාරී පාලනයෙන් ලංකාවේ අභ්‍යන්තරය මුදවා ගැනීමට සුදුසුම අවස්ථාව මෙය බව ආණ්ඩුකාරතුමා වටහා ගත්තේ ය. ක්‍රි.ව. 1814 නොවැම්බර් මාසයේ දී උඩරට රාජ්‍යයේ වෙළදාමේ යෙදී සිටි බ්‍රිතාන්‍ය යටත් වැසියන් දසදෙනෙකුගේ අත්පා කපා, වධ හිංසා කිරීමට රජු ක්‍රියා කර ඇත. මෙම සිදුවීමෙන් කෝපයට පත් ආණ්ඩුකාරවරයා 1815 ජනවාරි 10 වැනි දින උඩරටට එරෙහිව යුද ප්‍රකාශ කළේය. ආක්‍රමණයට මුහුණදීමට නොහැකි වූ රජු ඇතුළු පිරිස මැද මහනුවර බෝමුරේ ග්‍රාමයට පළා ගියහ.[93] ක්‍රි.ව. 1815 පෙබරවාරි 18 වැනි දින ශ්‍රී ලංකාවේ අවසන් රජු ඇතුළු පිරිස ජීවග්‍රහයෙන් අල්ලා ගැනීමට ඉංග්‍රීසින් සමත් වූහ. මෙම ආක්‍රමණයේ දී රජුට එරෙහිව සිංහල ප්‍රභූන්ගේ සහයෝගය ඉංග්‍රීසීන්ට ලැබිණි. එහි වාසිය ඉංග්‍රීසීන් උපරිම සලසා ගත්තේ ය.

[1] තල්වත්ත, **අජිත්, කන්ද උඩරට රාජධානිය සහ 1818 කැරැල්ල** ආරිය ප්‍රකාශකයෝ, වරකාපොළ,2009, 64, ප

---

[91] කොඩ්රිංටන්. එච්. ඩබ්ලියු. **සංක්ෂිප්ත ලංකා ඉතිහාසය**, 69 පිට.

[92] පෙරේරා, එස්.ජී. **ලංකා ඉතිහාසය, බ්‍රිතාන්‍ය හා නිදහස් යුග 1796- 1956**, 53 පිට.

[93] තල්වත්ත, **අජිත්, කන්ද උඩරට රාජධානිය සහ 1818 කැරැල්ල** ආරිය ප්‍රකාශකයෝ, වරකාපොළ,2009, 64, පිට